# සම සෙනෙහස්, ද්වි සෙනෙහස් , සංක්‍රාන්තික ලිංගික, අන්තර් ලිංගික හා ලිංගිකත්වය ප්‍රශ්නවාචි (LGBTIQ) ප්‍රජාව මුහුණදෙන මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් සම්බන්ධව දකුණු ආසියානු ජාතික මානව අයිතිවාසිකම් ආයතන (NHRIs) වලට පැමිණිලි කරන ආකාරය

**මානව අයිතිවාසිකම් යනු -** සෑම මනුෂ්‍යයෙකුටම උරුම වන්නාවූ මූලික අයිතිවාසිකම් සමූහයකි. එම අයිතිවාසිකම් වලට මතු දැක්වෙන අයිතිවාසිකම් ද අඩංගු වන අතර එය අයිතිවාසිකම් වල පරිපූර්ණ ලැයිස්තුවක් නොවේ;ජීවත්වීමේ අයිතිය,කායිකව සුරක්ෂිත ව සිටීමේ අයිතිය, සියලුදෙනා සමඟ සමානව සැළකුම් ලැබීමේ අයිතිය,පුද්ගලික නිදහස පිළිබඳ අයිතිය, අනෙක් පුද්ගලයන් හමුවීමේ හා කණ්ඩායම් ඇති කරගැනීමේ නිදහස,තම මතය ප්‍රකාශ කිරීමේ නිදහස සහ බලහත්කාරයෙන් රඳවා තැබීම ට භාජනය නොවීමේ නිදහස.

**LGBTIQ** යන පදය සම සෙනෙහස්, ද්වි සෙනෙහස් සංක්‍රාන්තික ලිංගික, අන්තර් ලිංගික හා ලිංගිකත්වය ප්‍රශ්නවාචි වැනි විවිධ වූ ලිංගික නැඹුරුතාවයන් හා ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් හා ප්‍රකාශයන් සහිත පුද්ගලයන් හැඳින්වීමට යොදා ගන්නා කෙටි යෙදුමකි.මෙයට පෙරකී යෙදුම් වලින් හඳුන්වා ගන්නා හෝ නොගන්නා නමුත් විවිධ වූ ලිංගික නැඹුරුතාවයන්, ස්ත්‍රී පුරුෂ සමාජභාවී අනන්‍යතාවයන් පිළිගන්නා වූ දකුණු ආසියාවට අවේනික වෙනත් පදවලින්, උදාහරණ ලෙස හිජ්රා ("Hijra"), ඛවාජ සිරා කොති ("Khawaja Sira Kothi"), මෙති ("Methi") වැනි පදවලින් හඳුන්වන්නාවූ පිරිස් ද ඇතලත් වේ.

**පැමිණිල්ල** යනු මානව අයිතිවාසිකම් කඩකිරීමක් හෝ ප්‍රතික්ෂේප කිරීමක් සම්බන්ධව සිදුවූ දෙය,ස්ථානය,කඩකල පුද්ගලයා සහ තවත් විස්තර අඩංගු ලිඛිත හෝ වාචික ප්‍රකාශයකි.

**පැමිණිලිකරු** යනු පැමිණිල්ල කරන පුද්ගලයා ය.

**කඩකල / උල්ලංඝනය කල පුද්ගලයා** යනු වෙනත් පුද්ගලයකුගේ මානව අයිතිවාසිකම් කඩකල පුද්ගලයාය.

## 01. NHRIs වල කාර්‍යභාරය කුමක්ද?

- NHRIs තම රටවල් තුල සිටින්නාවූ ජනතාවගේ මානව අයිතිවාසිකම් සුරකීමේ කාර්‍යභාරය පැවරී ඇති සංවිධාන වේ.සෑම මිනිසෙකු සතුව මානව අයිතිවාසිකම් ඇත.මෙම මානව අයිතිවාසිකම් සෑම පුද්ගලයෙකුටම සහජ වන අතර ගෞරවාන්විතව හා නිදහසේ ජීවත් වීමට අත්‍යාවශ්‍ය වේ.

- සියූ පුදගලයන්ගේ ආරක්ෂාව සහතික කිරිම උදෙසා මෙම අයිතිවාසිකම් රටවල් අත්සන් කරන ලද අන්තර් ජාතික ගිවිසුම් වල හා ව්‍යවස්ථා වල පැහැදිලි ලෙස අඩංගු කර ඇත.
- අයිතිවාසිකම් කඩකිරීමේ චෝදනා විමර්ශනය කිරීම හා කඩකරන්නන් හට එරෙහිව දඬුවම් නිර්දේශ කිරීම තුලින් NHRIs වලට ආරක්ෂා කිරීමේ වගකීම් පැවරී ඇත්තේ මෙම මානව අයිතිවාසිකම් ය.
- සාමාන්‍යයෙන් NHRIs විමර්ශනය කරන්නේ පොලිස් නිළධාරීන් ,රාජ්‍ය සේවකයන් හා ජනබලධාරයන් වැනි ආණ්ඩුවේ සේවකයන් සිදුකරන මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම්ය.නමුත් සමහර අවස්ථාවන් හිදී පෞද්ගලික අංශය (සේවා යෝජකයන් වැනි ) සිදුකරන මානව අයිතිවාසිකම් කඩකිරීම් විසඳිම ට NHRIs ක්‍රියා කරයි.

02. **(LGBTIQ ) ජනතාව මුහුණදෙන්නා වු මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම් කවරේද@**

- සියූ පුද්ගලයන් මෙන් LGBTIQ ජනතාවට සුහසාධනයන් ඉෂ්ට කරගැනීමටත්,සමාජය තුල ජීවත්වීමට අවශ්‍ය වටිනාකම හා අභිමානය ළඟාකර ගැනීමටත් ඔවුන්ගේ මානව අයිතිවාසිකම් හා ආරක්ෂාවන් සහතික කල යුතුයි.නමුත් අවාසනාවන්ත ලෙස, අත්දැකීම් වලට අනුව පෙනීයන්නේ දකුණු ආසියාවේ බොහෝ රටවල අපරාධ නීතිය, සම ලිංගික ලිංගික හැසිරීම් දණ්ඩනයට ලක්කරන අතර සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන් සමාජයට හිරිහැරයක් ඇතිකරන චෝදනා ව මත තර්ජනය කිරීමට හා අත්අඩංගුවට ගැනීමට පොලිසියට බලය පවරා ඇති නිසා බහුතර අවස්ථාවල මෙම අයිතිවාසිකම් LGBTIQ පුද්ගලයන් ට නොලැබෙන බවයි.

- බොහෝ අවස්ථා වල LGBTIQ පුද්ගලයන්ගේ ලිංගික නැඹුරුතාවය හා ස්ත්‍රී පුරුෂ සමලිංගික අනන්‍යතාවය මත පදනම් ව වෙනස්කම් වලට භාජනය වේ.සිය නිවෙස් තුල, විද්‍යාල තුල, සේවා ස්ථානයන් තුල ,නිවාස කටයුතු හා සෞඛ්‍ය පහසුකම් භාවිතා කිරීමේදි මෙම වෙනස්කම් වලට මුහුණ දේ.සාක්ෂි වලට අනුව ඔවුන්ගෙන් බහුතරයක් අප්‍රසාදය පෙරදැරිකරගත් සැලකුම් ලබා ඇති අතර සමහර අවස්ථා වලදී සිය ලිංගික නැඹුරුතාවය අනාවරණය වු පසු රැකියා අත්හිටුවා ඇත. බොහෝ අවස්ථා වලදී සිය වඩා කැමති ස්ත්‍රී පුරුෂ සමාජ අනන්‍යතාවය පිළිගැනීමට ප්‍රතික්ශේප කරන නිසා ඔවුන්ට ඔවුන්ගේ මූලික හඳුනා ගැනීමේ පත් ලබා ගැනීමේදි බාධා ඇති වේ.

- බොහෝ විට ඔවුන්ගේ කායික හා මානසික පරිපූර්ණත්වය උල්ලංඝනය කරන ශාරීරික ප්‍රචණ්ඩ ක්‍රියා,බල කරන ලද පරිවර්තන ප්‍රතිකාරයන් (Conversion Therapy), අවමාන තර්ජන කිරීම් හා පැහැර ගැනීම්,නින්දා කිරීම් සහ ද්වේශ සහගත කථනයන්ට ඔවුන් මුහුණ දේ. මෙමගින් ඔවුන්ගේ ප්‍රචණ්ඩ ක්‍රියා වලින් ආරක්ෂා වීමට ඇති අයිතිය හා ආරක්ෂාව සහ රැකවරණය පිළිබඳ සහතිකය අවධානයට ලක් වේ.

- ලිංගිකත්වය,ලිංගික සෞඛ්‍ය සහ එච්.අයි.වී. පිළිබඳ තොරතුරු පළකරන සංවිධාන හා LGBTIQ පුද්ගලයන් ප්‍රචණ්ඩ ක්‍රියා අත්අඩංගුවට ගැනීම් හා වැඩ නැවැත්වීම් වලට මුහුණ දේ.එමඟින් ඔවුන්ගේ භාෂනයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය ද මෙම තොරතුරු ලබාගන්නාවු LGBTIQ පුද්ගලයන්ගේ සෞඛ්‍ය පිළිබඳ අයිතිය ද ප්‍රතික්ශේප වේ.

**03. (NHRIs) මෙම උල්ලංඝනය කිරීම් විසඳන්නේ කෙසේද?**

- සිය මානව අයිතිවාසිකම් කඩකිරීම් සම්බන්ධයෙන් පැමිණිලි කිරීමට අදහස් කරන පීඩිත LGBTIQ පුද්ගලයන් ට හෝ ඔවුන්ගේ නියෝජිතයන් ට NHRIs වලට පැමිණිලි කල හැක.එම ආයතන වල වගකීම වන්නේ මෙම පැමිණිලි සළකා බලා ඒවාගේ නිවැරදිතාවය හා අදාලත්වය විමසා බලමින් නිසිලෙස ප්‍රතිචාර දැක්වීම සහ තමන් වෙත ඉදිරිපත් කර ඇති උල්ලංඝනය කිරීම් පිළිබඳ විමර්ශන කිරීමයි.

**04. NHRIs පැමිණිලි ඉදිරිපත් කල හැක්කේ කාටද?**

- LGBTIQ පුද්ගලයකුගේ මානව අයිතිවාසිකම් කඩවීමට ලක්වුවහොත් තමන් ට,තම යහ;£වකුට,පවුලේ සාමාජිකයෙකු ට හෝ ඔහු නියෝජනය කිරීමට හැකියාව ඇති සංවිධානයකට හෝ කණ්ඩායමකට (රජයේ නොවන මානව අයිතිවාසිකම් සංවිධාන හෝ නිති{ හවුල් වැනි) NHRIs වලට පැමිණිල්ලක් ගොනු කල හැක.මෙය ලිඛිතව දුරකථනයක් ඔස්සේ විද්‍යුත් තැපෑල මඟින් හෝ පෞද්ගලිකවම NHRIs කාර්‍යාලයකදී කල හැක.

- පෙර දක්වන ලද ලෙස LGBTIQ පුද්ගලයකු වෙනුවෙන් පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමට සංවිධානයකටද හැකියාව ඇත.

- නිති{  වරයකුගේ උදවු අවශ්‍ය නොමැතිව ඕනෑම කෙනෙකුට ආයතන වල සේවය ලබා ගැනීම පහසු කිරීම උදෙසා  NHRIs වල පැමිණිලි ක්‍රමවේදයන් සරල කොට ඇත.

- මානව අයිතිවාසිකම් උල්ලංඝනය  කිරීමක් සම්බන්ධව පැමිණිල්ලක් නොමැති වුවද එවැන්නක් පිළිබඳව ආරංචි වූ පමණින් එම කඩකිරීම සම්බන්ධයෙන් විමර්ශනය කිරීමට එම ආයතන වලට බලය ඇත.

05. **NHRIs වලට  පැමිණිලි ඉදිරිපත් කරන්නේ කෙසේද@**

- NHRIs වලට පැමිණිලි කිරීමේ ක්‍රමවේදයන් බොහෝ විට සරල ඒවා වේ.එම පැමිණිලි වියදමකින් තොරව කල හැක.පුද්ගලයකුගේ පැමිණිල්ල සිදුකරන අවස්ථාවේදී යම්කිසි වියදමක් සිදු කල ද ශ්‍රී ලංකාවේ සමහර NHRIs  වලට එම වියදම පැමිණිලිකරුට නැවත ලබා දීමේ බලය ඇත.

- සාමානය රීතියට අනුව කඩකිරීම කලා යැයි චෝදනා ලබා ඇති පුද්ගලයා සිදුකළ හා නොකල ක්‍රියාවන් අතු¨ව මානව අයිතිවාසිකම් කඩකිරීම සම්බන්ධව තොරතුරු පැමිණිල්ල තුල අඩංගු විය යුතුයි.කඩකිරීම් සිදුවූ පසු හැකි ඉක්මනින් ඒ පිළිබඳ පැමිණිල්ල යොමු කළ යුතුයි.සමහර NHRIs උල්ලංඝනය සිදු වී පැමිණිල්ලක් ඉදිරිපත් කළ හැකි කාලයට සීමාවක් පණවා ඇත.ඉන්දියාවේ ආයතන උල්ලංඝනය සිදුවී වසරක් පසුවී කරන පැමිණිලි වලට ප්‍රතිචාර නොදක්වන අතර අනෙක් ස්ථාන වල එය නම්‍යශිලි වේ.පාකිස්තානයේ පැමිණිල්ලක් ඉදිරිපත් කිරීමේ සුදුසු ම කාල පරාසය යැයි සළකන්නේ මාස තුනකි.

06. **පැමිණිල්ලක් ලද පසු NHRIs වලට කල හැක්කේ කුමක්ද@**

- පැමිණිල්ලක් විමර්ශනය කර මානව අයිතිවාසිකම් කඩවීමක් සිදුවී ඇත්ද,එසේ නම් එය කිනම් අයිතිවාසිකම් කඩවීමක්ද, එය කා විසින් සිදුකර ඇත්ද යන්න විචාරීමට විවිධ වූ බලතල සමූහයක් NHRIs වලට ලබා දී ඇත.එසේ කිරීම සඳහා එම ආයතන සතුව විභාග කීරිමේ හා පරික්ෂා කිරීමේ බලය ඇත.

- පැමිණිල්ලක් විභාග කරන අවස්ථාවේදි, NHRIs වලට නෛතික අධිකරණයකට ඇති බලතල ඇති බවට බොහෝ විට සැළකේ.ඒ අනුව එවැනි ආයතන වලට මතු දැක්වෙන බලතල ඇත.

- අදාල තොරතුරු,ලියකියවිලි හා රාජකාරි ලේඛන ලබාදීමට සාක්ෂිකරුවන් ආදි පුද්ගලයන් ව සිය කාර්යාලයට කැඳවීමට, සහ

- සාක්ෂි,දිවුරා දුන් සාක්ෂි ආකාරයෙන් භාර ගැනීමට.

07. **පැමිණිලි කරුවෙකුට NHRIs වලින් ලැබිය හැකි පිළිසරණ කවරේද?**

- NHRIs වල විමර්ශන වලින් මානව අයිතිවාසිකම් කඩවීමක් හෙළිදරවු වුවහොත් එම ආයතන වලට පැමිණිලි කරුට විවිධ ආකාරයේ උදවු උපකාර ලබා දිය හැක.

- මින් සමහරක් නියමිත කාර්යයන් සිදුකිරීමට රජයට සපයන නිර්දේශයන් විය හැක.මෙහි කරදරයට පත්වූ තැනැත්තාට හෝ පවුලට වන්දි ගෙවීම සහ උල්ලංඝනය කල තැනැත්තාට එරෙහිව චෝදනා ගොනු කිරීම ඇතුලත් විය හැක.

- මානව අයිතිවාසිකම් කඩවීම් වලට අදාල නියෝගයන් ලබාගැනීම උදෙසා NHRIs වලට නෛතික අධිකරණ වලට චෝදනා ඉදිරිපත් කළ හැක.උල්ලංඝනය කල පුද්ගලයාට එම උල්ලංඝනය කිරීම නිවැරදි කිරීමට බල කිරීම හෝ මූල්‍ය දණ්ඩණයන් පැණවීම එම උසාවි නියෝග වලට ඇතුලත් විය හැක.කඩකිරීමට ලක්වූ තැනැත්තා සිරභාරයේ සිටී නම්,ඔහුට හරි ආකාරයට සලකන බව සහතික කරගැනීම ට NHRIs එම රැඳවුම් කඳවුර/ පොලිසියට යා හැක.

- සමහර අවස්ථා වල (ලංකාවේදි වැනි) එම අදාල පාර්ශවයන් ට සිය ආරවුල සමථයකට පත් කර ගැනීමට හෝ මැදිහත් සමාධානයකට එළඹීමට උත්සාහ කරන ලෙස අනුබල දීමටත්,ඒවා අසාර්ථක වුවහොත් පමණක් චෝදනා ඉදිරිපත් කරන ලෙසට උපදෙස් දීමටත් NHRIs බැදි සිටි.

- දකුණු ආසියාවේ සමහර NHRIs LGBTIQ පුද්ගලයන්ගේ මානව අයිතිවාසිකම් පැමිණිලි වලට ආධාර කොට ඇත.පහත දක්වන අවස්ථා ඒවා ට උදාහරණයන් වේ.

- ලිංගික නැඹුරුතාවය නිසා සිය රැකියාව අහිමි වූ පුද්ගලයෙකු ට එය නැවත ලබා ගැනිම තහවුරු කිරීම.

- සංක්‍රාන්තික ලිංගික පුද්ගලයන්ට එරෙහි ව පොලිසිය සිදුකරන ප්‍රචණ්ඩ ක්‍රියා හා බාධා කිරීම නැවැත්වීම හා

- නිවාස ලබාගැනීමේදි වෙනස් කොට සැළකිමට ලක්වුනු සංක්‍රාන්තික ලිංගික ගුරුවරයකුගේ විද්‍යාලයට දැන්විමක් නිකුත් කිරීම.

08. **NHRIs පැමිණිල්ලක රහස්‍යභාවය පිළිබඳ කටයුතු කරන්නේ කෙසේද?**

- සාමාන්‍යයෙන් NHRIs පැමිණිලි වල රහස්‍යභාවය රැකීමට බැඳී නැත.නුමත් පැමිණිලිකරුවෙක් ලෙස සිය අනන්‍යතාවය අනාවරණය කිරීමෙන් සාමාන්‍යයෙන් තර්ජන කිරීම් වලට ලක්විය හැකි නිසා LGBTIQ පුද්ගලයන් NHRIs වලට පැමිණිලි ඉදිරිපත් කරන විට එහි සිය අනන්‍යතාවය සඟවන ලෙස ඉල්ලන අභියාචනයක් අඩංගු කල යුතුය.

**පැමිණිල්ලක් අන්තර්ජාලය ඔස්සේ යොමු කිරීම ඇතු¿ව ඔබ ජීවත් වන ප්‍රදේශයේ තිබෙන NHRI පිළිබඳ වැඩිදුර තොරතුරු ලබාගැනීමට පහත සඳහන් වෙබ් අඩවි වලට පිවිසෙන්න.**

| | | |
|---|---|---|
| ඇ*ගනිස්ථානය | - | http://www.aihrc.org.af/ |
| බංග්ලාදේශය | - | http://www.nhrc.org.bd/ |
| ඉන්දියාව | - | http://nhrc.nic.in/ |
| නේපාලය | - | http://www.nhrcnepal.org/ |
| පාකිස්ථානය | - | http://www.mohr.gov.pk/ |
| ශ්‍රි ලංකාව | - | http://hrcsl.lk/ |

.